**ශ්‍රී ලංකා රේගුවේ රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල - 2023**

**----------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා රේගුවේ රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා අරමුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව,<br>(i) මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත සකස් කළයුතු වුවද, මූල්‍ය අංශයට ගෙවීම් සඳහා ලද ත්‍යාග ලිපි ගොනු පමණක් සැලකිල්ලට ගෙන, එම අංශයට නොලැබුණු විවිධ අංශයන්හි වැඩ අවසන්ව ඇති ත්‍යාග ගොනු සහ හිඟ දණ්ඩන ආදායම් නොසලකා හැර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි. | සියලු දණ්ඩන හා රාජසන්තක ද්‍රව්‍ය විකුණුම් ආදායම තාවකාලික රඳවා ගැනීමේ තැන්පතු ගිණුමට බැර කරනු ලබන අතර, එම මුදල් එම වර්ෂය තුළදීම ගෙවීම් සිදු නොවේ. විමර්ශන කටයුතු අවසන් වූ පසු ඇතැම් විමර්ශනයන්ට අදාල දඩ මුදල් ආපසු අදාල පුද්ගලයන් වෙත ගෙවීමට සිදුවන අවස්ථා ද ඇත. එබැවින් රේගු නිලධාරින් ගේ ත්‍යාග අරමුදලට මුදල් බැර කරනු ලබන්නේ විමර්ශන කටයුතු අවසන් කර ගෙවීම් සිදු කරනු ලබන අවස්ථාවේදී ය. මෙම තත්ත්වය ඉදිරි වර්ෂයන්හි අවසන් ගිණුම් පිළියෙල කරන විට විශේෂ හෙළිදරව් කිරීම් යටතේ සටහන් කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල විය යුතු බව. |
| (ii)ඉන්ධන අරමුදල, මත්ද්‍රව්‍ය නිවාරන අරමුදල සහ සහායක සේවා සපයන අංශවල නිලධාරීන් සඳහා ගෙවීම් අරමුදලේ (2.5% අරමුදල) සමුච්චිත ශේෂය වන රු.1,530,781,892 ක වටිනාකම ජංගම/ ජංගම නොවන වගකීම් ලෙස හඳුනාගැනීම වෙනුවට හිමිකම් යටතේ අරමුදල් වශයෙන් දක්වා තිබුණි. | මෙම උප අරමුදල්වල ඇති ශේෂයන් අවස්ථානුකූලව වියදම් දැරීමට සිදුවන බැවින්, එම ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වගකීම් ලෙස ඇතුලත් කරනු ලබන කොටසේ, අරමුදල් ලෙස දක්වා ඇත. කෙසේ වෙතත් ඉදිරියේදී මෙය ජංගම නොවන වගකීම් ලෙස දැක්වීමට සටහන් කර ගන්නා ලදී. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල විය යුතු බව. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුළදී සහායක සේවා සපයන අංශවල නිලධාරීන් සඳහා වූ අරමුදලින් (2.5% අරමුදල) රු. 25,530,106 ක් ගෙවා තිබුණ ද, මූල්‍ය ප්‍රකාශනයන්හි එය රු. 15,496,264 ක් වශයෙන් දැක්වීම නිසා එම ගෙවීම් රු. 10,033,842 න් අඩුවෙන් දක්වා තිබුණි. ඉහත වෙනස ගැලපීම සඳහා 2023 දෙසැම්බර් මාසය තුළදී ත්‍යාග අරමුදලින් අනෙකුත් සංචිත (other pools) සඳහා වූ අරමුදලට වෙන් කරන ලද ප්‍රමාණය රු.10,033,842 න් අඩුවෙන් දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වෙමි. | ගිණුම්ගත කිරීමේ දී සිදු වූ වැරදි විධිමත්ව නිවැරදි කළ යුතු බව. |
| (ආ) තෑගි අරමුදල් සඳහා ගෙවීමට ඉදිරිපත් වූ සමස්ථ ගොණුවල එකතු වටිනාකම රු.8,247,989,408 ක් වුවද, ගිණුම් සටහන් අංක 2.6.1 හි එය රු.3,295,256,449 ක් වශයෙන් වැරදියට හෙළිදරව් කර තිබුණි. තවද, එම ගිණුම් සටහනෙහිම ගෙවූ සමස්ථ ගොණුවල වටිනාකම වශයෙන් 2023 වර්ෂයේ ජනවාරි සිට මැයි දක්වා ගෙවූ ආසන්න වශයෙන් රු. 3,135,184,683 ක වටිනාකම නොසළකා හැර ජුනි සිට දෙසැම්බර් දක්වා පමණක් ගෙවූ රු. 7,846,092,400 ක අගයක් දක්වා තිබුණි. ඉහත වැරදි දත්ත මත පදනම්වීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු ත්‍යාග අරමුදලේ ශේෂය වශයෙන් දැක්වූ රු.200,948,504 ක වටිනාකම නිවැරදි බවට විගණනයේදී තහවුරු නොවුණි. | විගණන නිරීක්ෂණ හා එකඟ නොවේ. | මූල්‍ය ප්‍රකාශනයන්හි නිවැරදි තොරතුරු හෙළිදරව් කළ යුතු බව. |

**නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

### 1.5.3

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට වූ ශේෂ පිරික්සුමෙහි ඉන්ධන අරමුදල, මත්ද්‍රව්‍ය නිවාරණ අරමුදල | 1,844,632,679 | 1,382,870,064 | 461,762,615 | ශේෂ පිරික්සුමේ අරමුදල්වල ආරම්භක ශේෂය දක්වා ඇති අතර මූල්‍ය ප්‍රකාශයේ | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දැක්වෙන ශේෂ, එයට අනුරූපී උපලේඛණ/ |

| | | | |
|---|---|---|---|
| (නාකොටික් අරමුදල), සහායක සේවා සපයන අංශවල නිලධාරීන් සඳහා ගෙවීම් අරමුදල (2.5% ක අරමුදල) සහ අනෙකුත් සංචිත (other pools) සඳහා වූ අරමුදල්වල බැර ශේෂයන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දැක්වූ ශේෂයන් සමඟ පිළිවෙලින් රු.180,744,198 ක්, රු. 61,565,303 ක්, රු.87,735,802 ක් සහ රු.131,717,312 ක් වශයෙන් එකතුව රු.461,762,615 න් නොසැසඳී තිබුණි. | | දක්වා ඇත්තේ අවසාන ශේෂයයි. විගණනය විසින් පෙන්වා දී ඇති වෙනසට හේතු ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයෙහි පැහැදිලිව දක්වා ඇත. | වාර්තා සමඟ සැසඳිය යුතු බව. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1968 අංක 17 දරන රේගු ආඥා පනතේ 153 (2) (ආ) වගන්තිය | (i) ත්‍යාග අරමුදලින් ත්‍යාග මුදල් බෙදා හැරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කල යුතු වුවද , 1988ජනවාරි 28 දින අංක පීඑල් 118 දරන දෙපාර්තමේන්තු නියෝගය සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන ඇති බවට තහවුරු කර ගැනීමකින් තොරව 2012 වසරේ සිට 2023 වර්ෂය දක්වා වූ වර්ෂ 12ක් තුළ ත්‍යාග අරමුදල් ලෙස නිලධාරීන් සඳහා රු 19,429,331,820. ක්ද ඔත්තුකරුවන් සඳහා රු 2,980,886,848.ක් ද බෙදා හැර තිබුණි. | දෙපාර්තමේන්තු චක්‍රලේඛ ප්‍රතිපාදන අනුව පවතින අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන ඔත්තුකරුවන්ට හා විමර්ශන සඳහා මූලිකව ක්‍රියා කරන පාර්ශවයන්ට ගෙවීම් සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්ට අනුමැතිය ලබා දීමට හැකියාව පවතී. | රේගු ආඥා පනතේ විධිවිධානයන්ට අනුගත විය යුතු බව. |
| | (ii) රේගු ආඥා පනතේ 153(2) (ආ) වගන්තිය ප්‍රකාරව මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කළ යෝජනා ක්‍රමයකට අනුව ත්‍යාග මුදල් අදාල නිලධරයන් සහ තොරතුරු සපයන්නන් අතර බෙදා දීම | රේගු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය සියලු අංශවල නිලධාරීන්ගේ දායකත්වය මත සිදු වන කාර්ය සාධනයක් වන | රේගු ආඥා පනතේ විධිවිධානයන්ට අනුගත විය යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | සිදුවිය යුතු වුවද ,අංක පීඑල් 118 දරන දෙපාර්තමේන්තු නියෝගයට 1988 සිට මේ දක්වා සංශෝධන 19ක් පමණ ගෙන එමින් රාජ්‍ය සන්තක මුදල් සහ දණ්ඩන මුදල් එකී කාර්යයන්ට ඍජුව දායකත්වය නොසපයන රේගුවේ අනිකුත් අංශ 18 ක නිලධාරීන්ට ද බෙදා දීමට කළමනාකරණය කටයුතු කර තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය සඳහා එවැනි අංශවල නිලධාරීන්ට වෙන්කළ ත්‍යාග අරමුදල් වටිනාකම රු.444.437.389 ක් විය. | බැවින් සෑම අංශයකම නිලධාරීන්ගේ අභිප්‍රේරණය හා දිරි ගැන්වීම උදෙසා රේගු වැටලීම් හා සම්බන්ධව අදාල වන සියලු අංශවල නිලධාරීන් නියෝජනය වන පරිදි ත්‍යාග මුදල් බෙදා දීමට කටයුතු කර ඇති බව සඳහන් කරමි. | |
| (ආ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය- මු.රෙ.102 සහ 110 | විදේශීය පුද්ගලික ආයතනයක් විසින් නැවකින් නැවකට භාණ්ඩ මාරු කිරීමේ ක්‍රමය යටතේ (Transhipment) සිංගප්පූරුවෙන් නැව්ගත කරනු ලැබූ දුම්වැටි තොගයකට අදාළව සිදු කරන ලද විමර්ශන අවසානයේ එම දුම්වැටි තොගය රු5,901,750. ක වෙන්දේසිකර තිබුණිකෙසේවුවද ., එම විකිණීමට එරෙහිව අදාල විදේශ ආයතනය විසින් පැවරූ නඩු වලින් රේගුව වැරදිකරු වී තිබුණු බැවින් රේගුවට මෙම වැරදි තීරණය මත රු 69,451,809.ක් ගෙවීමට සිදු වී තිබුණි මෙම විමර්ශනයට අදාළ . ගොනුව ද පසුව අස්ථානගත වී තිබුණු ඉහත වැරදි තීරණයට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව දින 11 මැයි 2023 පත් කරන ලද මූලික විමර්ශන කමිටු වාර්තාව ඉන් මාස දෙකක් ඇතුළත ඉදිරිපත් කළ යුතුව පැවතුණ ද, 2024 මැයි 30 දින වන විට ද ඉදිරිපත් කර නොතිබුණි. | මූලික විමර්ශන කමිටු සභාපති විසින් මූලික විමර්ශනයේ වර්තමාන තත්ත්වය පිළිබඳව කරුණු දක්වමින් 2024.03.19 දින අතුරු වාර්තාවක් ඉදිරිපත් කර ඇත. එහි දක්වා ඇත්තේ මේ සම්බන්ධයෙන් ඇති අධිකරණ කටයුතු පිළිබඳව ඇති නඩු වාර්තා ලද විගස විමර්ශන කටයුතු අවසන් කර, අවසන් වාර්තාව ලබා දෙන බවයි. තවද, මේ වන විට මූලික විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කිරීමට පියවර ගෙන ඇත. | මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධානයන්ට අනුගත විය යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 424,344,028 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 217,437,608 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 206,906,420ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට දණ්ඩන මුදල් රු. 2,426,905,437 ක් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අවිධිමත් ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)ආනයනකරුවෙකු විසින් ඔහුට අදාළව සිදුකරන ලද රේගු විමර්ශනයක ප්‍රතිඵලයක් වශයෙන් පැනවූ අභිමිකිරීමක් සහ දණ්ඩනයකට එරෙහිව නඩුවක් පවරා තිබුණු අතර ඉන් රේගුව අයකර ගත් මුදලින් රු.31,000,000 ක් ආනයනකරුට ආපසු ගෙවීමට නියම වී තිබුණි. අභිමිකිරීම් සහ දණ්ඩන වටිනාකමින් සියයට 50ක් මෙම අරමුදලට බැර වෙන නමුත් ත්‍යාග මුදල් ලබාගත් නිලධාරීන් ආසන්න වශයෙන් 541 ක් පමණ සිටියදී, ඔවුන්ගෙන් කිසිදු මුදලක් ආපසු අයකර නොගෙන ඒකාබද්ධ අරමුදලට බැර කළ ප්‍රමාණය සහ කළමනාකරණ හා වන්දි අරමුදලට බැර වූ ප්‍රමාණය ආපසු ගෙන ආනයනකරුට වන්දි මුදල ගෙවීමට කටයුතු කර තිබුණි. | ත්‍යාග ගොනුව සම්පූර්ණයෙන් ගෙවා අවසන් කිරීමේදී, ත්‍යාග ගොනුවට අදාල නිලධාරීන්ට මෙන්ම සංචිත අරමුදල් (Pool Fund) වෙනුවෙන් වෙන්කළ මුදල්වලින් නිලධාරීන් 541 කට ආසන්න පිරිසකට මුදල් ගෙවා තිබීමත් රු.2,716,696 ක් රජයේ බදු ලෙස ගෙවා තිබීමත් නිසා එම රු.මිලියන 29ක මුදල අය කිරීමට ප්‍රායෝගිකව අපහසු බව පෙන්වා දීමෙන් පසු අදාල ආයතනය එම නිලධාරීන්ගෙන් අය කිරීමකින් තොරව ගෙවිය හැකි මුදල පමණක් ලබා ගැනිමට එකඟවීම මත මුදල් ආපසු ගෙවා ඇත. | රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීමට අවශ්‍ය පියවර ගත යුතු බව. |
| (ආ)පුද්ගලික සමාගමක් විසින් ව්‍යාජ ඉන්වොයිසි ඉදිරිපත් කර ආනයනය කරන ලද සත්ව ආහාර තොගයකට අදාළව එම සමාගම පැහැර හැරීමට උත්සාහ දැරූ බදු වටිනාකම රු.15,198,755 ක් වූ අතර අඩුවෙන් දැක්වූ භාණ්ඩ වටිනාකම (Under Value) රු.63,519,586 ක් විය. කෙසේවුවද, විමර්ශන අවසානයේ දී වංචා කිරීමට උත්සහ කළ තීරු බදු වටිනාකම සඳහා රු.500,000 ක ලිහිල් කරන ලද අභිමි කිරීමක් සහ අඩුවෙන් දැක්වූ භාණ්ඩ වටිනාකම සඳහා රු.19,000,000 ක අභිමි කිරීමක් පමණක් පැනවීමට විමර්ශන නිලධාරියා කටයුතු කර තිබුණි. එහිදී පැහැර හැරීමට උත්සාහ දැරූ බදු වටිනාකමට සාපේක්ෂව පැනවූ දණ්ඩනය සියයට 3.2 ක පමණ ඉතා අඩු ප්‍රමාණයක් විය. එබැවින් රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීම සඳහා රේගුව වඩා සැලකිල්ලෙන් කටයුතු කළ යුතු බවට මෙහිදී අවධාරණය කෙරේ. | එකී රු.500,000/-ක මුදල ලිහිල් කරන ලද අභිමි කිරීමක් ලෙස රේගු ආඥා පනතේ 129 සහ 163 වගන්ති යටතේ පනවා ඇත්තේ වංචා කිරීමට උත්සාහ කරන ලද තීරු බදු වටිනාකමට නොව, රේගු වරද දැනුවත් භාවයෙන් යුතුව සිදු කර තිබීම යන තත්ත්වය සැලකිල්ලට ගැනීමෙනි. එකී විමර්ශන ලිපිගොනුවට අනුව, රේගු දණ්ඩන මුදල් පනවා ඇත්තේ විධිමත් රේගු පරීක්ෂණයක් පැවැත්වීමෙන් (customs inquiry) පසුවයි. තවද, විමර්ශන නිලධාරියා විසින් ලිහිල් කරන ලද අභිමි කිරීම සිදු කිරීම රේගු නීති ප්‍රතිපාදනවලට අනුව නෛතික රාමුව තුළ සිදු කර ඇත. | රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීමට අවශ්‍ය පියවර ගත යුතු බව. |
| (ඇ) ඉන්දියාවේ සිට සුදු සීනි ලෙස අනාවරණය කර ආනයනය කරන ලද සීනි තොගයක් රේගුවේ අවදානම් කළමනාකරණ ඒකකය (RMU) මගින් දැඩි අවදානම් සහිත බවට වර්ගීකරණය කර ගැඹුරින් පරීක්ෂාවට | | |

| | | | |
|---|---|---|---|
| | යොමුකර තිබුණ ද, එම කාර්යය නිසි ලෙස සිදු නොවීම හා තෝරාගත් නියැදිය දෝෂයන් හඳුණා ගැනීමට තරම් ප්‍රමාණවත් නොවීම නිසා එම බහාලුම් තුළ දුඹුරු සීනි තොගයක්ද තිබිය දී රේගුවෙන් භාණ්ඩ නිෂ්කාශනය කර තිබුණි. කෙසේවුවද, අනුකූලතා හා පහසුකම් සැලසීමේ අංශයට පසුව ලද තොරතුරකට අනුව සිදු කරන ලද පරීක්ෂාවේ දී ප්‍රකාශ නොකරන ලද දුඹුරු සීනි බහාලුම් 20 ක් ද එහි ඇති බවට අනාවරණය කරගෙන තිබුණි. මේ පිළිබඳව කරන ලද විමර්ශන අවසානයේ ආනයනකරුට එරෙහිව රු.500,000 ක දඩයක් සහ රු.189,293,778 ක අභිමි කිරීමක් පනවා තිබූ අතර ආනයනකරු එකී දණ්ඩනයට එකඟවීම මත රාජසන්තක නොකර රු.190,000,000 ක බැංකු ඇපකරයක් මත භාණ්ඩ තොගය රේගු භාරයෙන් නිදහස් කරගෙන තිබුණි. ඒ අනුව පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | රේගු ආඥා පනතේ 165 වගන්තිය ප්‍රකාරව පනවන ලද දණ්ඩනය ලිහිල් කරන මෙන් ආනයනකරු විසින් සිදු කරන ලද අභියාචනය පළමු අවස්ථාවේදී අමාත්‍යවරයා විසින් ප්‍රතික්ෂේප කර තිබුණු අතර පසුව එම අභියාචනය සැලකිල්ලට ගෙන පනවන ලද දණ්ඩනය රු.මිලියන 30 කින් අඩු කිරීමට කටයුතු කර තිබුණි. දෙවන අවස්ථාවේ එපරදි සිදු කරන ලද ලිහිල් කිරීමට හේතු පැහැදිළි නොවුණි. | ගරු මුදල් අමාත්‍යවරයා විසින් දණ්ඩන මුදල රුපියල් මිලියන 30 කින් ලිහිල් කිරීමට තීරණය කර තිබුනේ අතර රේගු ආඥා පනතේ 165 වගන්තිය අනුව වේ. | රේගු ආඥා පනතේ විධිවිධානයන්ට අනුගත විය යුතු බව. |
| (ii) | මෙම ලිහිල් කිරීම නිසා රජයට සිදුව තිබූ සමස්ත රාජ්‍ය ආදායම අහිමි වීම රු.56,106,333 ක් විය. | ප්‍රශ්නගත දුඹුරු සීනි තොගය වූ මෙට්‍රික් ටොන් 607.55 ප්‍රමාණය නීත්‍යානුකූලව ආනයනය කලේ නම්, ඒ සඳහා ගෙවිය යුතු බදු මුදල රු. 56,410,083 ක් බව රේගු පරීක්ෂණය තුල දී ගණනය කිරීමේ ක්‍රියාවලිය තුලින් නිරීක්ෂණය විය. සුදු සීනි සහ දුඹුරු සීනි යන වර්ග දෙකෙන්ම යුක්ත වූ මුළු සීනි තොගයෙහි බර මෙට්‍රික් ටොන් 1,214.90 ප්‍රමාණයක් වන අතර, එකී මුළු ප්‍රමාණයම සුදු සීනි ලෙස ප්‍රකාශ කරමින් රු.303,750 ක බදු මුදලක් ආනයනකරු විසින් රජයට ගෙවා තිබුණි. | රජයට අයවිය යුතු ආදායම් නිසිපරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)2023 වර්ෂයේදී අවසන් කරන ලද විමර්ශන පිළිබඳව සිදුකළ නියැදි විගණනයකට අනුව ආනයනකරුවන් විසින් අවස්ථා 10ක දී විවිධ රේගු වැරදි සිදුකර රු.59,583,245 ක බදු මුදලක් ගෙවීම පැහැර හැරීමට උත්සාහ දරා තිබුණු අතර, ඒ සඳහා රේගුව විසින් පැනවූ මුලු දණ්ඩන වටිනාකම රු. 1,821,501,276ක් විය. දණ්ඩන වටිනාකම පසුව ලිහිල්කිරීම නිසා එය රු.88,116,774 ක් දක්වා අඩු වී තිබුණු අතර ලිහිල් කළ දණ්ඩන වටිනාකමින් රජයට බැර කල සියයට 30 ක (30%) වටිනාකම රු.26,435,033 ක් වූ අතර පැහැර හැරීමට උත්සාහ කළ බදු මුදල වූ රු.59,583,245 ට සාපේක්ෂව එය රු.33,148,213 කින් රාජ්‍ය ආදායම අඩු වීමකි. මෙලෙස දණ්ඩන පනවා උපයන ලද මුදලින් රජයට උපයාගත හැකිව තිබෙන ආදායම, සාමාන්‍ය ක්‍රමවේදය තුළින් රජයට ලැබෙන බදු ආදායමටද වඩා පහල අගයක් ගැනීම තුල රේගුව රජය වෙනුවෙන් ආදායම් ඉපයීමේ ප්‍රධානතම වගකීම දරනු ලබන ආයතනයක් වශයෙන් විචක්ෂණශීලීව කටයුතු කර තිබේද යන්න ගැටලු සහගත විය. | රේගු පරීක්ෂණයකදී දෙන තීරණය අර්ධ අධිකරණයකින් දෙන තීරණයක් හා සමාන වේ. රේගු පරීක්ෂණයක් අවසානයේ තීරණ දෙනු ලබන්නේ පරීක්ෂණයේදී ඉදිරිපත් වූ සියළුම සාක්ෂි සැලකිල්ලට ගනු ලැබීමෙන් වන අතර, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන 129, 130, 163 හා 166B හි වගන්තිවල දක්වා ඇත. | රජයට අයවිය යුතු ආදායම් නිසිපරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ආ)රේගු ආඥා පනතේ 129 වගන්තිය ප්‍රකාරව ආනයනයන්හි දී තීරු බදුවලින් හෝ එහි යම් කොටසක් වංචනිකව මඟහැරීමේ හෝ මඟහැරීමට තැත් කිරීමේ හෝ දැන දැනම සම්බන්ධ වන සෑම තැනැත්තකු රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කැමැත්ත පරිදි, එකී භාණ්ඩවල වටිනාකම මෙන් තෙගුණයක අභිමිවීමකට යටත් කළ හැකිය. කෙසේවුවද, නියැදි විගණනයට අනුව අවස්ථා 3 කදී පමණක් එකී භාණ්ඩවල වටිනාකමට සමාන අගයක් දණ්ඩන ලෙස පනවා තිබුණු අතර ඉතිරි අවස්ථා 7 හි දීම භාණ්ඩවල වටිනාකමට | -එම- | රේගු ආඥා පනතේ විධිවිධානයන්ට අනුගත විය යුතු බව. |

| | | |
|---|---|---|
| වඩා අඩු අගයක් දණ්ඩන ලෙස පැනවීමට කටයුතු කර තිබුණි. ඒ අනුව රේගු වැරදි සඳහා සැළකිය යුතු දණ්ඩනයක් පැනවීමට අපොහොසත් වීමෙන් අදාළ පුද්ගලයින් තව දුරටත් වැරදි වංචා සිදු කිරිමට පෙළඹවීමක් ඇති විය හැකි බව විගණනයේදී බැහැර කළ නොහැකිය. | | |
| (ඇ) දණ්ඩන පැනවීමේදී එකී කඩකිරීමේ බරපතලකම, කඩකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් අහිමි වූ ආදායම් ප්‍රමාණය සහ කඩකිරීම සිදුකරන ලද භාණ්ඩවල අවස්ථාවෝචිත පරිදි සුලභ බව හෝ හිඟකම ආදිය රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා සැලකිල්ලට ගත යුතු වුවද, රේගු ආඥා පනතේ 166 වගන්තියේ නොදැක්වුණු ආනයනකරුවන්ගේ මූල්‍ය දුෂ්කරතාවය දණ්ඩනය ලිහිල් කිරීමේ හේතුව ලෙස දක්වමින් දණ්ඩනය අඩු කළ අවස්ථා ද විය. | -එම- | රේගු ආඥා පනතේ විධිවිධානයන්ට අනුගත විය යුතු බව. |
| (ඈ)2023 වර්ෂයේදී අවසන් වූ විමර්ශන සඳහා පාදක වූ රේගු වැරදි වර්ගයන් පිළිබඳව සැළකිල්ලට ගත් කළ විමර්ශන 1902 ක් අතුරින් ප්‍රකාශ නොකළ භාණ්ඩ ආනයනය කිරීමට අදාළව 498 ක් වූ අතර ඊට අමතරව අතිරික්ත ප්‍රමාණයක් ආනයනය කිරීම සම්බන්ධ විමර්ශන 224 ක් ද, වටිනාකම අඩුවෙන් තක්සේරු කිරීම සම්බන්ධ විමර්ශන 207 ක්ද විය. කෙසේවුවද, ශක්තිමත් නීති පද්ධතියක් ස්ථාපිත කිරීම තුළින් මෙම සාමාන්‍ය රේගු වැරදි සැළකියයුතු මට්ටමකින් අඩුකරගත හැකි වන අතර රජයට ලැබිය යුතු ආනයනික බදු ආදායම නිසි පරිදි නිසි කළට රජයට ලබා ගැනීමේද හැකියාව පවතින බැවින් ඒ සඳහා කළමනාකරණයේ අවධානය යොමුවිය යුතුව පැවතුණි. | -එම- | ශක්තිමත් නීති පද්ධතියක් ස්ථාපිත කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුවිය යුතු බව. |
| (ඉ)භාණ්ඩ නිශ්කාෂණ ක්‍රියාවලියට සම්බන්ධ වන රේගුවේ අංශ රාශියක් සිද්ධි හේතුවෙන් ආරම්භවන රේගු විමර්ශන කටයුතු වල නිරතව තිබුණ ද, එකී විමර්ශනයන්හි ප්‍රගතිය දැනගැනීමේ ක්‍රමවේදයක් නොවුණ අතර එක් එක් අංශ තනි තනිව විමර්ශන කටයුතු සිදුකර | මේ පිළිබඳව මධ්‍යගත කිරීමේ ක්‍රමවේදය සඳහා CCR ලේඛනයක් පවත්වා ගෙන යනු ලබන අතර, එය වැඩිදියුණු කිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටියි. | මධ්‍යගත තොරතුරු පද්ධතියක් ශ්‍රී ලංකා රේගුව සතුව පවත්වාගත යුතු බව. |

විමර්ශන අවසාන වූ පසු ත්‍යාග ගෙවීම් සඳහා මුදල් අංශයට යොමුකර තිබුණි. විමර්ශන ගොනු පිළිබඳ තොරතුරු එක් එක් අංශවල විමධ්‍යගතව පැවතුණු අතර ඒ අනුව විමර්ශන ප්‍රගතිය පිළිබඳව කළමනාකරණ තීරණ ගැනීමට සහ කාර්යසාධන පරීක්ෂාවට ද අවශ්‍ය මධ්‍යගත තොරතුරු පද්ධතියක් දෙපාර්තමේන්තුව සතුව නොපැවතුණි.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) රේගු විමර්ශන සඳහා අවශ්‍ය ඉන්ධන වියදම් පියවා ගැනීම අරමුණු කරගෙන ත්‍යාග අරමුදලේ උප අරමුදලක් වශයෙන් ඉන්ධන අරමුදල පිහිටුවා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ද රු.181,298,698 ක් එම අරමුදලට බැර කර තිබුණි. කෙසේවුවද, විමර්ශන කටයුතු සඳහා දරන ඉන්ධන පිරිවැය රේගුවේ පොදු වැය ශීර්ෂයට වැය බරක් වී තිබීම හේතුවෙන් 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වාම එම අරමුදලෙන් කිසිදු වියදමක් දරා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දී පමණක් රු.554,500 ක වියදමක් දරා තිබුණි. ඒ අනුව සැබෑ අවශ්‍යතාවයකින් තොරව දිගින් දිගටම මෙම අරමුදලට මුදල් රැස්කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට එහි සමුච්චිත ශේෂය රු.940,499,772 ක් වී තිබුණි. | නිරීක්ෂණය හා එකඟ වෙමි. | අරමුදල් පරිහරණය පිළිබඳව අවධානය යොමු කළ යුතු බව. |
| (ආ)ත්‍යාග අරමුදලේ උප අරමුදලක් වන මත්ද්‍රව්‍ය වැටලීම් සඳහා සහභාගි වන නිලධාරීන් වෙනුවෙන් ගෙවීම් සඳහා වන මත්ද්‍රව්‍ය නිවාරණ අරමුදලට (නාකොටික් අරමුදල) සමාලෝචිත වර්ෂය තුළදී රු. 61,565,304 ක් බැර කර තිබුණු නමුත් වර්ෂය තුළ ඉන් කිසිදු මුදලක් ගෙවා නොතිබුණි. | නිරීක්ෂණය හා එකඟ වෙමි. | අරමුදල් බෙදා වෙන්කිරීම පිළිබඳව අවධානය යොමුකළ යුතු බව. |
| (ඇ)සමාලෝචිත වර්ෂය ආරම්භයේදී ඉන්ධන අරමුදල, මත්ද්‍රව්‍ය නිවාරණ අරමුදල, සහායක සේවා සපයන අංශවල නිලධාරීන් සඳහා ගෙවීම් අරමුදල (2.5% අරමුදල) සහ අනෙකුත් සංචිත අරමුදල යන අරමුදල්වල සමුච්චිත ශේෂය වන රු.1,420,288,652 කින් රු.818,564,381 ක් හෙවත් සියයට 58 ක ප්‍රමාණයක් 2017 වර්ෂය හා ඊට පෙර සිට | රේගු ආඥා පනතේ 153 (2) (ආ)අනුව ත්‍යාග මුදල් ගෙවීම සඳහා ගොනු ඉදිරිපත් කිරීමේදී අදාල අරමුදල් සඳහා ත්‍යාග ගොනුවේ මුළු මුදලින් යම් ප්‍රතිශතයක් වෙන් කරනු ලබන බැවින් එම මුදල මෙම අරමුදල් සඳහා බැර කරන අතර ගෙවීම් සිදුකරනු ලබන්නේ අදාල | අරමුදල් බෙදා වෙන්කිරීම පිළිබඳව අවධානය යොමුකළ යුතු බව. |

| | | |
|---|---|---|
| පැවතෙන ශේෂයන් වන අතර, රු.384,985,028 ක් හෙවත් සියයට 27 ක ශේෂය වසර 2ත් - 5ත් අතර කාලයක සිට පැවතෙන ශේෂයන් වේ. ඒ අනුව සමුච්චිත ශේෂයේ කාල විශ්ලේෂණයක් සිදුකිරීමේදී වසර ගණනාවක සිට මුදල් වැය කිරීමේ අවශ්‍යතාවයකින් තොරව මෙම උප අරමුදල් පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය. | ඉල්ලීම් පදනම් කරගෙන වේ. එසේ ඉල්ලීමක් ලැබෙන තෙක් එම අරමුදල් ශේෂය සමුච්චිතව පවතී. | |
| (ඇ) ශ්‍රී ලංකාවට භාණ්ඩ ආනයනයේ දී හා අපනයනයේ දී ඊට සම්බන්ධ ආනයනකරුවන්, අපනයනකරුවන් හා අනෙකුත් පාර්ශවයන් විසින් සිදුකරනු ලබන වංචා හා වැරදි සම්බන්ධ රේගු නිලධාරීන් විසින් අනාවරණය කරගත් හෝ ඔත්තුකරුවන් විසින් ලබාදෙන ලද තොරතුරු මත රේගු විමර්ශන ආරම්භ කරනු ලබන අතර රේගුවේ විවිධ අංශ විසින් එපරිදි සිදුකරන රේගු විමර්ශන අතර 2023 දෙසැම්බර් 31 දින වන විට විවිධ අංශ යටතේ සිදු කරන විමර්ශන 8450 ක් පැවතුණි. ඉන් විමර්ශන 3080 ක් වසර 05කට වඩා ද, විමර්ශන 4348 ක් වසර 02 සිට වසර 04ක් දක්වා ද, විමර්ශන 1022 ක් වසරක් තුළද නොවිසඳී ප්‍රමාද ව පැවතුණි. විමර්ශන ප්‍රමාදවීම මත අත් අඩංගුවට ගත් භාණ්ඩ නශ්‍ය වීම, හායනය වීම, පසු කාලීන අලෙවියෙන් නිසි වටිනාකමක් ලබා ගැනීමට නොහැකි වීම, ඔත්තුකරුවන් සහ නිලධාරීන් අධෛර්යයට පත් වීම ආදී අවාසිදායක තත්ත්වයන් පැන නැගී තිබුණි. තවද, මෙලෙස විමර්ශන ගොනු අවසන් කිරීම ප්‍රමාද වීම තුළ රජයට ලැබිය යුතු ආදායම් ලැබීමේ ප්‍රමාදයක් ද සිදු වී තිබුණි. | රේගු විමර්ශන අවසන් කිරීමේ ප්‍රමාදය සඳහා පහත හේතු බලපා ඇත.<br>අදාල පාර්ශවයන්,<br>i. අධිකරණ ක්‍රියාමාර්ගවලට යොමුවී තිබීම හා එම ක්‍රියාමාර්ගවල ප්‍රමාදයන්.<br>ii. ක්‍රමවත්ව සහභාගි නොවීම.<br>iii. රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත හෝ මුදල් අමාත්‍යවරයා වෙත අභියාචනා ඉදිරිපත් කර තිබීම.<br>iv. විමර්ශන වෙනුවෙන් ඉල්ලීම් කරන ලද ලේඛන රේගුව වෙත ලැබීමට සැලකිය යුතු කාලයක් ගතවීම.<br>v. කොවිඩ් 19 වසංගත තත්ත්වයේ බලපෑම.<br>vi. කාර්ය මණ්ඩලය හිඟ වීම.<br><br>කරුණු එසේ වුවත් ප්‍රමාදයන් අවම කර ගනිමින් විමර්ශන කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටියි. | විමර්ශන කඩිනමින් අවසන් කිරීමට පියවර ගත යුතු බව. |